**සීමා සහිත ස්ටේට් ෆර්ටිලයිසර් සමාගම - 2024/ 2025**
---------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමා සහිත ස්ටේට් ෆර්ටිලයිසර් සමාගමේ ("සමාගම") 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 09 සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 09 සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 මාර්තු 31 දිනෙන් අවසන් මාස 09 සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 09 සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සමාගමේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගම සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමට ලැබෙන මුදල් කලින් ලැබීම් (Receipt in Advance) නම් වූ පාලන ගිණුමක් තුළ සටහන් කර පසුව විකුණුම් ඇතුළු වෙනත් ආදායම් ගිණුම් වෙත මාරු කිරීමට සමාගම විසින් කටයුතු කලද, මූල්‍ය වර්ෂය අවසාන දින වන විට එම ගිණුම තුළ නිශ්චිතව හඳුනා නොගත් සමාගම වෙත ලැබී තිබුණු රු.27,992,228 ක් නිරවුල් නොවී ඉතිරිව පැවතීම හේතුවෙන් කාලච්ඡේදයේ විකුණුම් වටිනාකමෙහි නිරවද්‍යතාවය සම්බන්ධයෙන් තහවුරුවක් ලබා ගැනීමට විගණනයට නොහැකි විය. | එකඟ වේ.<br>ඉදිරි ලැබීම් ගිණුම තුළ සියළුම විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු මුදල් සටහන් කර ඇති අතර එහි ශේෂයන් වශයෙන් සඳහන් වන්නේ මුදල් ගෙවා ඒ දක්වා විකුණුම් වශයෙන් නිකුත් නොකළ පොහොර ප්‍රවාහනයට අදාළ මුදල් වේ. | ලැබීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව භාණ්ඩයේ අයිතිය සහ අවදානම මාරුවන අවස්ථාවේදී ගැණුම් සහ විකුණුම් හඳුනා ගැනීම සිදුකළ යුතු වුවද, පොහොර ලැබීම් (GRN) සහ නිකුත් කිරීම් (Dispatch) සිදු කරන අවස්ථාවේදී සමාගම විසින් ගැනුම් සහ විකුණුම් හඳුනානොගෙන | වර්තමානයේදී මෙම GRN හා Dispatch යන අවස්ථාවන් පරිඝණකගත කර ඇති අතර එම අවස්ථාවේදීම ගිණුම් ස්වයංක්‍රියව යාවත්කාලීන වේ. | ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

පොහොර සඳහා ගෙවීම් සිදුකරන හා මුදල් ලැබෙන අවස්ථාවේදී ගැනුම් සහ විකුණුම් ගිණුම්ගතකර තිබුණු අතර වර්ෂය අවසානයේ පමණක් උපචිත හා ලැබිය යුතු වටිනාකම් ලෙජර් ගිණුම් තුළ ගැළපීම් සිදුකර තිබුණි.

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහජන බැංකුව විසින් සමාලෝචිත කාල පරිච්ඡේදය අවසාන දිනට ලබාදුන් ශේෂ සනාථන ලිපිවලට අනුව භාණ්ඩාගාර බිල්පත් හා REPO ආයෝජනයන්හි වටිනාකම් සහ එම බිල්පත්වලට අදාළ ලැබිය යුතු පොලී ආදායම මූල්‍ය ප්‍රකාශන තුළ සඳහන් වටිනාකමට වඩා පිළිවෙලින් රු.39,622,953 කින් හා රු.4,452,958 කින් අඩුවීම හේතුවෙන් ජංගම වත්කම් රු.44,075,911 කින් හා වර්ෂයේ ලාභය රු.4,452,958 කින් වැඩියෙන් දැක්වුණි. | එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | කාලච්ඡේදයට අදාළ ආයෝජන වටිනාකම හා පොළී ආදායම් නිවැරදිව තහවුරු කරගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | කාලච්ඡේදයේ ආරම්භක ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් සහ REPO පොලී ආදායම් ශේෂය තුළ ගිණුම්ගතකර ඇති රු.3,814,272 ක පොලී ආදායම් සමාලෝචිත කාලච්ඡේදයේ පොලී ආදායම් ලෙස ගිණුම්ගතකර තිබුණු බැවින් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. තවද ලැබියයුතු පොලී ආදායම වන රු.47,398,980 ක වටිනාකම දෙවරක් ගිණුම්ගතකර තිබීම හේතුවෙන් කාලච්ඡේදයේ ලාභය සහ ජංගම වත්කම් රු.51,213,252 කින් අධිගණනය වී තිබුණි. | එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | කාලච්ඡේදයට අදාළ පොළී ආදායම් හා ලැබිය යුතු පොළිය නිවැරදිව ගණනයකර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති රු.486,567,428 ක පොලී ආදායම තුළ ලැබිය යුතු පොලී ආදායම වන රු.295,818,965 ක වටිනාකම ඇතුළත්කර තිබීම හේතුවෙන් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වන මුදල් ප්‍රවාහයෙහි මුදල් ගලාඒම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මේ පිළිබඳව වැඩිදුර අවධානය යොමු කර ඉදිරි ගිණුම් වර්ෂයේදී නිසි ලෙස මුදල් ප්‍රවාහය නිරූපණය කිරීමට කටයුතු කරමි. | මුදල් ගලා ඒම් සහ මුදල් ගලායාම් නිසි පරිදි ගණනයකර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාගම විසින් මහජන බැංකුවෙහි සහ ලංකා බැංකුවෙහි පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු ගිණුම් ශේෂවල එකතුව, ශේෂ සනාථන ලිපි අනුව එකතු ශේෂයන්ට වඩා රු.197,869,358 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | එකඟ වේ. ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී මුදල ස්ථාවර තැන්පතු ගිණුමේ සඳහන් නොවීම හේතුවෙන් එහි වටිනාකම අවතක්සේරු වී ඇත. | කාලච්ඡේදයට අදාළ වත්කම් නිවැරදිව වටිනාකම තහවුරු කරගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | පොලී ආදායම ගණනය කිරීමේ උප ලේඛනය අනුව සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාළව ගණනය කරන ලද ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.59,523,629 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබීම හේතුවෙන් කාලච්ඡේදයේ ලාභය සහ ජංගම වත්කම් රු.59,523,629 කින් ඌන ගණනය වී තිබුණි. | එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | කාලච්ඡේදයට අදාළ ලැබියයුතු පොලිය හා පොලී ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත කාල පරිච්ඡේදයේ වියදම් ගිණුම් තුළ ඒකාබද්ධ වූ සමාගම් දෙකට අදාළව පෙර කාල පරිච්ඡේදයට අදාළ වියදම් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත කාල පරිච්ඡේදයේ ලාභය රු.16,431,150 කින් ඌන ගණනය වී තිබුණි. | එකඟ වේ. මෙම වියදම් පෙර කාලච්ඡේදය සඳහා උපචිත නොකිරීම හේතුවෙන් මෙම දෝෂය හටගෙන ඇත. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | කාලච්ඡේදයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාගමේ කළමණාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් සිදුකළ ගෙවීම රු.5,100,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණ ද, සමාලෝචිත කාලච්ඡේදයේදී එවැනි ගෙවීම් සිදුකර නොතිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා යාම් රු.5,100,000 කින් අධි ගණනය වී ඇති බව නිරීක්ෂණය විය. | කෙරීගෙන යන වැඩ ගිණුම වෙනුවට අස්පෘශ්‍ය වත්කම් ගිණුම හර කිරීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දෝෂය හටගෙන ඇත. | මුදල් ගලා ඒම් සහ මුදල් ගලායාම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ නිවැරදිව ගණනය කර ඉදිරිපත්කළ යුතුය. |
| (ඌ) | ඉහත (උ) හි සඳහන් කළමණාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපනය කිරීමේ දී සමාගම සමඟ ඇතිකරගන්නා ලද ගිවිසුම ප්‍රකාරව රු.5,100,000 ක කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 20 ක් පමණක් සම්පූර්ණ කර තිබුණු නමුත් සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකම අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන තිබුණු බැවින් අස්පෘශ්‍ය වත්කම් එම වටිනාකමින් අධිගණනය වී තිබුණු අතර සමාගමට ගෙවිය යුතු රු.1,020,000ක් උපචිත වියදම් හා ඉතිරිය වෙනත් ණයහිමි ලෙස ගිණුම්ගතකර තිබීම හේතුවෙන් නොනිමි වැඩ රු.1,020,000 කින් | එකඟ නොවේ.<br>අප්‍රේල් 24 දින ගෙවීම් කරන ලද රු.1,020,000ක මුදල සමාලෝචිත කාලයට අදාළ වියදමක් හෙයින් උපචිත කර දක්වා ඇත. | කාලච්ඡේදයට අදාළ වත්කම් හා වගකීම් නිවැරදි වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඌනගණනය හා ජංගම වගකීම් රු.4,080,000කින් අධිගණනය වී තිබුණි. | | |
| (එ) | 2024 ජුලි මස 04 සහ 2024 ජුලි මස 05 යන දිනයන්හිදී සමාගම වෙත ලැබී තිබූ ගැනුම් ඇණවුම් අංක 2560 යටතේ වූ SA (Sulphate of Ammonia) පොහොර මෙට්‍රික් ටොන් 125 කට අදාළ රු.8,029,660 ක් ප්‍රවර්තන කාලච්ඡේදයේ ගැණුම් ලෙස හඳුනාගෙන නොතිබීම හේතුවෙන් කාලච්ඡේදයේ ලාභය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි. | සමාගම් දෙක ඒකාබද්ධය සිදු වූ දින ආසන්නයේ සිදු වූ ගනුදෙනුවන් හේතුවෙන් යම් යම් ප්‍රායෝගික ගැටළු මත භාණ්ඩ ලැබීමේ නියෝග නිකුත් කිරීමේදී සිදු වී ඇති ප්‍රමාද දෝෂයන් මත එම නිවේදන වල දිනයන් වෙනස් වී ඇත. | කාලච්ඡේදයට අදාළ ගැණුම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | ඒකාබද්ධ සමාගමේ ආරම්භක ශේෂ පැරණි පොහොර සමාගම් දෙකෙහි අවසාන ශේෂයන් සමඟ සැසඳීම් කිරීමේදී, රඳවාගත් ඉපයුම් වටිනාකමෙහි රු.35,247,373 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වටිනාකමින් සමාගමේ හිමිකම අවතක්සේරු වී තිබුණි. | එම වෙනසට හේතුව වූයේ පූර්ව වර්ෂයන් සඳහා අදාළව සිදු කරන ලද වියදම් සමූහයක් රඳවාගත් ඉපයුම් වලින් අඩුකර විගණිත ගිණුම් සඳහා ලබාදීමය. | ඒකාබද්ධ සමාගමේ ආරම්භක ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | ගබඩා භාරකරුවන් විසින් සමාගමේ තබා ඇති ඇප තැන්පතු, ඉතිරි කිරීමේ ගිණුමක හා ස්ථාවර තැන්පත් ගිණුම් තුළ තැන්පත් කර තිබුණු අතර එම ගිණුම් තුළ 2024 ජුලි 01 දිනට රු.4,248,601 ක ශේෂයක් පැවතුණි. එයින් අනිවාර්යය විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය යටතේ ඉවත්ව ගිය නිලධාරීන් 53 දෙනෙකු සඳහා රු.2,747,400 ක ඇප තැන්පතු ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය මඟින් නිදහස් කර තිබුණද, එම මුදල අදාළ බැංකු ගිණුමට බැර නොකර ඇප තැන්පතු ගිණුමටම බැරකර තිබීම හේතුවෙන් සමාගමේ ජංගම වත්කම් හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි. | එකඟ වේ.<br>ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | කාලච්ඡේදයට අදාළ ඇප තැන්පත් ගෙවීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | ඒකාබද්ධ වූ සමාගම් දෙකට අදාළව වර්ෂ 03 සිට 05 දක්වා කාලයක සිට පැවත එන හිමිකම් නොපෑ රු.2,865,850ක ආපසු ගෙවනු ලබන ලංසු ඇපකර සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන්ගෙන් විමසීමකින් පසු ආපසු ගෙවීමට හෝ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආදායමට ගැනීමට කටයුතු කිරීමකින් තොරව දීර්ඝ කාලයක සිට ජංගම වගකීමක් ලෙස දක්වා තිබුණි. | එකඟ වේ.<br>ඉදිරි ගිණුම් වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ලාභයට ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු වටිනාකම් තහවුරුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමට ගබඩාවක් ඉදිකිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින් දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදී ඇති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් හම්බන්තොට බදු ඉඩමේ ගබඩාවක් ඉදිකිරීමට කටයුතු සිදුකිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවට පසුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කර තිබුණද, 2018 වර්ෂයේ ඒ වෙනුවෙන් දරා තිබුණු රු.3,732,901 ක ප්‍රාරම්භක වියදමක් මූල්‍ය ප්‍රකාශන තුළ තවදුරටත් ප්‍රාග්ධන නොනිමි වැඩ යටතේ දක්වා ඇති අතර අදාළ බදු ඉඩම නැවත භාර දීමටද මේ දක්වා කටයුතු කර නොතිබුණි. | එකඟ වේ.<br>බදු ඉඩම නැවත භාරදීම සඳහා මහවැලි අධිකාරිය වෙත විගණිත දින වන විටත් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර මේ වන විට පසු විපරම් වට කීපයක් ද සිදු කර ඇත. | ඉඩම පවරාදීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.) | වෙනස (රු.) | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| බැංකු ණය ශේෂය | 15,403,979,534 | 15,371,541,427 | 32,438,106 | එකඟ වේ.<br>ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශේෂ තහවුරු කිරීම් වලට අනුව නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.5 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සී/ස ලංකා පොහොර සමාගම සහ සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම 2024 ජුලි 01 සිට සී/ස රාජ්‍ය පොහොර සමාගම නමින් ඒකාබද්ධ කිරීමේදී සමාගම් දෙක අතර ඇති ණයගැති සහ ණයහිමි ශේෂයන් නිරවුල් කළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි. ඒ අනුව සී/ස ලංකා පොහොර සමාගම නමින් වෙළඳ ණයගැති ශේෂය තුළ රු.240,570 ක ණයගැති ශේෂයක් වූ අතර ඊට අදාළ වෙන් කිරීම් තුළ රු.4,857,456 ක ශේෂයක් ඇතුළත්කර තිබීමට හේතු | එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නව ඒකාබද්ධ සමාගමේ ණයගැති හා ණයහිමි ශේෂයන් නිරවුල් කළ යුතුය. |

ඉදිරිපත් නොවූ අතර එහි නිරවද්‍යතාවය තහවුරුකර ගැනීමට විගණනයට නොහැකි විය.

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් සමාගමට අයවිය යුතු ණය ශේෂ | රු.515,625,263 | සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ණයගැති ශේෂයෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන 259 කට අදාළ එකතු වටිනාකම රු.204,165,411 ක ණය ශේෂයන්ට අදාළව ලබාගත් ශේෂ සනාථනයන්ට අනුව එම මධ්‍යස්ථාන විසින් සමාගමට ගෙවිය යුතු එවැනි ණය ශේෂ නොතිබීම හේතුවෙන් එම ශේෂයන්හි නිවැරදිතාවය හා පැවැත්ම සම්බන්ධයෙන් තහවුරුකර ගැනීමට විගණනයට නොහැකි විය. | එකඟ වේ. මෙම විගණන විමසුමට අදාළ සවිස්තරාත්මක පිළිතුරු ඇමුණුම් මඟින් ඉදිරිපත් කරනු ලබන බව දන්වා සිටිමි. | මෙම ශේෂ සනාථ කිරීමට අදාල වන සාක්ෂි නොපමාව ලබාදිය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ ජංගම වගකීම් තුළ දක්වා ඇති වර්ෂ 05 ඉක්මවූ 2008 සහ 2022 කාල පරාසයට අයත් රු.7,694,697 ක් වූ විවිධ ණයහිමි ශේෂයන් සනාථ කර ගැනීමකින් පසු නිරවුල් කිරීමට හෝ නිසි ක්‍රමවේදයකට අනුව ණයහිමි ශේෂ කපාහැරීමට කටයුතුකර නොතිබුණි. | එකඟ වේ. මෙහි සඳහන් ණයහිමි වටිනාකමට අදාළ ඉතිරි මුදල් පරීක්ෂා කර බලා ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු වටිනාකම් තහවුරුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සහනාධාර ක්‍රමය යටතේ අලෙවි කරමින් පැවති TSP පොහොර තොගයෙන් සමාගම විසින් මිලදී ගත් මෙ.ටොන් 1333 සඳහා ගෙවිය යුතු මුදල් රු.83,000,000 ක් සමාගම විසින් සමාලෝචිත කාලච්ඡේදය අවසාන වන විටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි. | එකඟ වේ. සමාගම විසින් TSP පොහොර සඳහා මේ දක්වා මුදල් මහා භාණ්ඩාගාරය වෙත ගෙවීම් කර නොමැත්තේ මෙතෙක් එම පොහොර සමාගමට පවරා ගැනීමට අනුමැතිය ලැබී නොමැති හෙයිනි. | භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වටිනාකම් කාලීනව ප්‍රේෂණය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත මාස 09 හි මෙහෙයුම් ප්‍රතිඵලය රු.385,225,727 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ මාස 09ක කාලච්ඡේදය සඳහා සී/ස ලංකා පොහොර සමාගමේ සහ සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ ලාභයන්හි එකතුව රු.325,374,372 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.59,851,355 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම වැඩිවීම සහ විකුණුම් පිරිවැය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිසර හිතකාමී දේශීය පොහොර මිලදී ගැනීමේ ව්‍යාපෘතිය යටතේ 2021/2022 වර්ෂයේ මිලට ගෙන අම්පාර, හොරොව්පතාන, මැදවච්චිය, නොච්චියාගම, බදුල්ල, මඩකලපුව, දෙහිගහලන්ද, කොණ්ඩාවිල්, හිඟුරක්ගොඩ හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය ගබඩාවන් වල වැඩි වශයෙන් නොවිකිණී ඉතිරිව පවතින කාබනික පොහොර ප්‍රමාණය මෙ.ටොන් 2,487 ක් වන අතර එහි වටිනාකම රු.32,835,355 කි. විගණිත දිනය වූ 2026 මාර්තු 04 දින වන විටත් මෙම පොහොර සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | එකඟ වේ. රාජ්‍ය ආයතන, ගොවිපළවල් වෙත ලබා දීමට කටයුතු කරමින් පවතී. | ඉතිරිව පවතින පොහොර සම්බන්ධව ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවීන් වෙත බෙදා හැරීම සිදු නොකළ 2023 දෙසැම්බර් මස 20 දින වන විට කල් ඉකුත් වී ඇති වටිනාකම රු.5,095,300 ක් වූ මි.ලීටර 500 දියර පොහොර බෝතල් 2,510 ක් සමාගමේ ගබඩාවල පැවතියද විගණිත දිනය වූ 2026 මාර්තු 04 දින වන විටත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එකඟ වේ. | කල් ඉකුත් වූ දියර පොහොර ප්‍රමාණය සම්බන්ධව ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නව සමාගම සඳහා අනුමත කාර්ය මණ්ඩලය 181ක් බව නිරීක්ෂණය වුවද, පූර්ණ අයිතිය රජය සතුවන ව්‍යාපාරයක් වන මෙම සමාගම වෙනුවෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු අනුමතකරගෙන නොමැති බව නිරීක්ෂණය වූ අතර විගණිත දිනය වූ 2026 මාර්තු 04 දිනට සමාගමේ තත්‍ය කාර්ය මණ්ඩලය 161 ක් විය. ඒ අනුව තනතුරු 20 ක පුරප්පාඩු පැවති අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 ක්, තෘතියික මට්ටමේ තනතුරු 05 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 01 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක් පවතින බව නිරීක්ෂණය විය. | නව සමාගම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරද ඇතුලත්ව 213 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමතකර ගැනීම පිණිස, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.<br>තනතුරු පුරප්පාඩු අතුරෙන් අත්‍යාවශ්‍ය තනතුරු 18 ක් සඳහා සුදුසු පුද්ගලයින් බඳවාගැනීට අනුමැතිය ලබාගැනීමට සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත ඉදිරිපත්කර ඇති අතර, අනුමැතිය ලද පසු කඩිනමින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. | කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ඇතුළත් කරන ලද මුදල් රෙගුලාසි 877(2) ඇ සහ 2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර | එකඟ වේ.<br>සමාගම් ඒකාබද්ධය ආයතනයේ දෛනික කාර්යභාරයට පරිභාහිරව සිදු කටයුත්තක් හේතුවෙන් සීමිත පළපුරුද්දක් සහිත සීමිත සේවක | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයන්ට පෙර විගණකාධිපති වෙත |

| | | |
|---|---|---|
| ලේකම්ගේ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි ඡේද අංක 6.6 ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත සමාගමේ මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2024/2025 මූල්‍ය වර්ෂයට අදාළව 2025 මාර්තු 31 දිනට ඉදිරිපත් කළ යුතු මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 316 කට පසුව විගණනය වෙත ඉදිරිපත් කරන ලද අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | සංඛ්‍යාවක් සමඟ ඉහත කාර්යයන් සිදු කිරීම විගණන විමසුමේ දැක්වෙන ප්‍රමාදයන්ට හේතුකාරක වේ. | ඉදිරිපත්කළ යුතුය. |

## 4.2 අරමුණු සහ සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2021 මඟින් ඉදිරිපත්කර ඇති රජය සතු ව්‍යාපාර සඳහා වන ආයතනික පාලන මාර්ගෝපදේශයට අනුව, සමාගමේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය ලේඛනය ඇතුළත්ව වර්ෂ 05 ක කාලයක් සඳහා පිළියෙල කරන ලද සමාගමේ උපාය මාර්ගික සැලැස්ම සකස්කර නොතිබුණි. කෙසේ වෙතත් නව සමාගමට අදාළ සංයුක්ත උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේ කාර්යය රු.4,950,000 කට බාහිර පාර්ශවයකට පවරා දී ඉන් සියයට 60 ක ප්‍රමාණයක් එනම් රු.2,970,000 ක මුදලක් 2025 ජනවාරි 31 දින ගෙවා තිබුණි. | සංක්ෂිප්ත කරන ලද සංයුක්ත උපාය මාර්ගික සැලැස්මක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ලිඛිත අනුමැතියක් මෙතෙක් අප වෙත ඉදිරිපත් කර නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනය වෙත ඉදිරිපත්කරන ලද ඒකාබද්ධිත සමාගමේ සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් 2024/2025 මූල්‍ය වර්ෂයට අදාළ මූලධන අයවැය ඇස්තමේන්තුව අනුව පොහොර මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.100,000,000 ක් ඇස්තමේන්තුකර | රජයේ සමාගම් ඒකාබද්ධ වීමෙන් පසු 2025/26 මූල්‍ය වර්ෂය සඳහා රු.මිලියන 125 ක මුදලක් මිශ්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ඇස්තමේන්තු කළ අතර පොහොර සඳහා වන විවෘත වෙළඳපොළ තුළ මිශ්‍ර පොහොර අලෙවිය වර්ධනයට එය | ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ඇස්තමේන්තුව අනුව ප්‍රසම්පාදන කටයුතු නිශ්චිත කාලවකවානු තුළ |

| | | | |
|---|---|---|---|
| | තිබුණත් මූල්‍ය වර්ෂය අවසන් වන තෙක් එවැනි යන්ත්‍රයක් මිලදී ගෙන නොතිබුණි. පසුව 2025/2026 මූල්‍ය වර්ෂ අයවැය මගින්ද ඒ වෙනුවෙන් මුදල් වෙන්කර එහි ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන හා තාක්ෂණික කමිටු පත්කර තිබුණද, ප්‍රසම්පාදනයට අදාළ ලංසු ලේඛන සකස් කර අවසන් කිරීම මෙම වාර්තාව නිකුත් කරන දිනය වන තෙක් සිදුකර නොතිබුණි. පෙර පැවති සමාගම් විසින් දීර්ඝ කාලයක සිට විශාල පිරිවැයක් දරමින් මිනිස් ශ්‍රමය භාවිතාකර පොහොර මිශ්‍ර කිරීමේ කටයුතු සිදුකළ අතර එම සමාගම් ඒකාබද්ධ වීමෙන් පසුවද පොහොර මිශ්‍ර කිරීමේ කාර්යය වෙනුවෙන් මාස නමයක කාලච්ඡේදයක් සඳහා ආසන්න වශයෙන් රු.22,350,331 ක් දරා තිබුණි. | ඉවහල් වන බව කළමනාකාරිත්වයේ අපේක්ෂාව වේ. මේ වන විට මිශ්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක වන අතර විගණන විමසුමෙන් දක්වා ඇති ආකාරයට එමගින් රු.මිලියන 22කින් විකුණුම් පිරිවැය අඩු කළ නොහැකි වන්නේ යන්ත්‍රය භාවිතා කළද මිශ්‍රණ ක්‍රියාවලිය සඳහා තවදුරටත් මිනිස් ශ්‍රමය හා විදුලිය අවශ්‍ය වන බව පෙන්වා දෙනු කැමැත්තෙමි. | සිදුකල යුතුය. |
| (ආ) | සමාගම ඒකාබද්ධ කිරීමෙන් පසු 2024 ජුනි 30 සිට 2025 මාර්තු 31 දක්වා මාස 09 ක කාලපරිච්ඡේදය තුළ හුණුපිටිය ප්‍රධාන කාර්යාලය මඟින් සිදුකරන ලද විකුණුම් වලින් සියයට 61 ක ප්‍රතිශතයක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, පොල් වගා කිරීමේ මණ්ඩලය හා ගොවිජන සේවා මධ්‍යස්ථාන සමඟ සහනාධාර මිල ගණන් යටතේ හෝ ණය පදනම මත පොහොර සැපයීම සඳහා ඇතිකරගත් ගිවිසුම්වලට අදාළව සිදුකරන ලද විකුණුම් වන අතර නව සමාගම විසින් ඍජුව සිදුකරන ලද විකුණුම් සියයට 39 ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. | වසර ගණනාවක සිට රාජ්‍ය පොහොර සමාගම් ඍජු සහනාධාර පොහොර වී වගාව සඳහා බෙදාහැරීම ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා සිදු කළ අතර පෞද්ගලික සමාගම් ඍජු හා මිශ්‍රණ පොහොර අලෙවි නියෝජිතයන් හරහා බෙදාහැරීම සිදු කරන ලදී.<br>රාජ්‍ය සමාගමක් ලෙස මූල්‍ය රෙගුලාසි වලට අවනත විය යුතු බැවින් ඉහත පරිදි ආකර්ශනීය වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැකි වීම හේතුවෙන් පෞද්ගලික අංශය හරහා අලෙවිය අඩු වී ඇත .තවද පොහොර ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව පොහොර ප්‍රසම්පාදනය කල යුතු බැවින් පෞද්ගලික අංශයට වඩා ඉහළ මිලක් රාජ්‍ය පොහොර සමාගම සඳහා සැපයුම්කරුවන් ඉදිරිපත් කරයි .ඒ හේතුවෙන් අප සමාගම හට ආකර්ශනීය වෙළඳ වට්ටම් අලෙවි නියෝජිතයන් හට ලබා දීමට නොහැකි වීමද ඍජු පොහොර අලෙවිය පහළ යාමට හේතු වී ඇත. | සමාගම සිය අලෙවි ඉලක්ක සපුරා ගැනීම සඳහා උපායමාර්ගිකව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024/2025 මූල්‍ය වර්ෂයේ මාස 08 ක කාලච්ඡේදයක් සඳහා අනුමත කරන ලද අයවැය ඇස්මේන්තුව තුළ එම කාලච්ඡේදයේ විකුණුම් පරිමාව පොහොර මෙ.ටොන් 54,000 ක් ලෙස ඇස්මේන්තුකර තිබුණද, එම කාලච්ඡේදයට අදාළ සත්‍ය විකුණුම් පරිමාව පොහොර මෙ.ටොන් 21,907 ක් පමණක් විය. කෙසේ වෙතත් එම අයවැය තුළ විකුණුම් ප්‍රවර්ධනය වෙනුවෙන් රු.මිලියන 42.9 ක් ඇස්තුමේන්තු කර තිබුණද නව සමාගම ස්ථාපනය කිරීමේදී එම සමාගම ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් රු.මිලියන 41 කට ආසන්නව දරන ලද වියදම් හැරුණුකොට, විකුණුම් ප්‍රවර්ධන කටයුතු සිදුකර නොතිබුණි. | මෙ.ටොන් 20,000ක යූරියා පොහොර ප්‍රසම්පාදනය සඳහා තෝරාගත් සැපයුම්කරු හට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අවශ්‍යතා සපුරාලීමට නොහැකි වීම හේතුවෙන් 2024/25 මූල්‍ය වර්ෂය තුළ අපේක්ෂිත විකුණුම් ඉලක්කය වෙත ලඟා වීමට නොහැකිවිය. ඒ අනුව ඇති වූ පොහොර හිඟය, අලෙවිය සීමා කිරීමට හේතු වී ඇත.<br>නව සමාගම ස්ථාපනය කිරීමේදී මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා පුළුල් ප්‍රචාරණයක් ලබා දුන් අතර එය සෘජුවම අලෙවිය වර්ධනයට බලපාන බව දන්වා සිටිනු කැමැත්තෙමි. ඒ අනුව සමාගම ප්‍රවර්ධනයේදී එම සන්නාමය යටතේ පවතින පොහොර ද සෘජුවම ප්‍රවර්ධනය වන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | සමාගම තම අයවැයගත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපායමාර්ගිකව කටයුතු කළ යුතුය. |